# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

Invest in Sri Lanka Tourism

Sri Lanka Tourism
Development Authority

# සංචාරක සංවර්ධන අරමුදල
# 2013
# වාර්ෂික වාර්තාව

2014 ජූලි 17

**ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා පා. ම.**
**ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා**

**ගරු අමාත්‍යතුමනි**

**<u>සංචාරක සංවර්ධන අරමුදල</u>**

2005 අංක 38 දරණ සංචාරක සංවර්ධන පනතේ 23 (1) වගන්තිය අනව සංචාරක සංවර්ධන අරමුදල ස්ථාපිත වී ඇති අතර මෙම අරමුදලෙහි මුල්‍යයන් සංචාරක සංවර්ධනය සහ ප්‍රවර්ධනය වෙනුවෙන් යෙදවිය යුතු වේ. මෙම අරමුදල වෙනුවෙන් මුල්‍යයන් එකතු කිරීම් සහ බෙදා හැරීම් 2003 අංක 25 දරණ මුදල් පනත සහ 2005 අංක 38 දරණ සංචාරක පනත අනුව තීරණය වේ.

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (2) (අ) වගන්තිය අනුව සංචාරක අපගමන බදු ආදායමෙන් 1/3 ක ප්‍රමාණයක් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවනු ලැබේ. තවද, සංචාරක ක්ෂෙත්‍රයට අයත් ආයතන වලින් කාර්තු පදනම මත සංචාරක සංවර්ධන බදු වශයෙන්ද මෙම අරමුදලට එකතු වේ.

2013 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදයට අදාල සංචාරක සංවර්ධන මුල්‍යයන්හි එකතුව රුපියල් මිලියන 2625.1 ක් වේ. 2012 වසරේ එම මුල්‍ය ප්‍රමාණය රුපියල් මිලියන 1974.8 ක් වේ.

මෙම වාර්තාව මගින් 2013 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලට මුල්‍යය එකතු වීම සහ මුල්‍යයන් බෙදා හැරීම සම්බන්ධ විස්තර අඩංගු වී ඇත.

**ස්තුතියි**

**මෙයට විශ්වාසී**

**අ / කලේ**

**ඩී. එස්. ජයවීර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

# මූල්‍ය ප්‍රකාශන - පටුන


| | පිටු අංක |
|---|---|
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය | 01 |
| මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශනය | 02 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 03 |
| ගිණුම් වලට අදාල සටහන් | 04-07 |

### සංචාරක සංවර්ධන අරමුදල
### ´|Ù] õõ|<× û|}|ýú| û|æ$Á×
### 2013 µ÷|&`Èý Ì 31 ÷|ù ð

| | &ð{ù | 2013<br>Ø` | 2012<br>Ø`. |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| ´÷Ù &{ ´÷Ù &´$ù à×õ´×ù | | 822,889,099.72 | 278,352,579.52 |
| Ù`Ã× ×õ ´Ù]×ù | 8 | 633,886,904.04 | 401,496,310.67 |
| **´\|_ <õ\|æÈ** | | **1,456,776,003.76** | **679,848,890.19** |
| **ජංගම වත්කම්** | | | |
| µèÑ× ×õ ´Ù]×ù | 9 | 3,890,830.99 | 2,068,724.71 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | | 203,403,924.19 | 94,889,223.17 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය | | 1,017,019,620.94 | 474,446,115.84 |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | | 174,346,220.73 | 81,333,619.86 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය | | 58,115,406.91 | 27,111,206.62 |
| **´\|_ <èæ\|È** | | **1,456,776,003.76** | **679,848,890.19** |

**à$ë$Ì× ². ä&\|. ì×ÒØ**
**àø]æ\|Â ìùØ$Ù\|**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**û\|. äù\|. ÷\|&$ù$×æ**
**àø]æ\|Â / ´\|Ù] æ}´ù$æØó**
**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

# සංචාරක සංවර්ධන අරමුදල
## ´¦Ù] æ$Ì×× &$øù û¦æ$Áù×
### 2013 µ÷¦&`. 31 ÷¦µùù¦ à<&ù¦ <ÌÂ× &ú¦{$

| | &ð{ù | 2013<br>Ø`. | 2012<br>Ø`. |
|---|---|---|---|
| **à$÷¦$×´** | | | |
| ý÷ | 3 | 2,619,040,948.38 | 1,971,124,560.78 |
| àµùæõ à$÷$×È | 4 | 6,099,936.95 | 3,749,067.37 |
| **´¦_ à$÷¦$×´** | | **2,625,140,885.33** | **1,974,873,628.15** |
| **Ñ×÷¦È** | | | |
| àØ´÷µÙ ûÍû$Ùù Ñ×÷È | 5 | 5,193,657.45 | 4,162,318.08 |
| ´Ù] Ñ×÷È | 6 | 5,943.00 | 7,192.86 |
| àØ´÷Ù µý÷${`ÎÈ | 7 | 2,619,941,284.88 | 1,970,704,117.21 |
| **´¦_ Ñ×÷¦´** | | **2,625,140,885.33** | **1,974,873,628.15** |
| **àõ¦Íæ¦õ× (ã[ùõ$<×)**<br>**æ$Ù ûÍ§µ¨÷¦× &ú¦{$** | | - | - |

සංචාරක සංවර්ධන අරමුදල

**´Ù] ûl<${ ûlæ$Á×**

**2013 µ÷&`Èýì 31 ÷µù ùl à<&ùl <ìÂ× &úl{$**

| | 2013 |
|---|---|
| | Ø`. |
| **´Ù] û<${× µ´µ{×È æ×$æ$ØæÈ õÙù** | |
| Á÷ø àõÍæõ× (ã[ùõ$<×) - µ´µ{×È æ×$æ$ØæÈ õÙù | - |
| | |
| **æ$Øæ û$èø ùµ× µ<ù& - ´Ù] èÙ$ äÈ (èÙ$ ×$È)** | |
| <`± Ò´ / (àòÒ´) ´Ù] µèÓÈ | 776,927,113.57 |
| àòÒ´ / (<`± Ò´) ´Ù] Ù`ÄÈ | (232,390,593.37) |
| | |
| Á÷ø ´Ù] û<${× µ´µ{×È æ×$æ$ØæÈ õÙù | 544,536,520.20 |
| **´÷Ù &{ ´÷Ù &´$ù à×õ´ 2013.01.01** | **278,352,579.52** |
| **´÷Ù &{ ´÷Ù &´$ù à×õ´ 2013.12.31** | **822,889,099.72** |

**ගිණුම් වලට අදාල සටහන්**

**1. සංචාරක සංවර්ධන අරමුදල**

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (1) වගන්තිය යටතේ සංචාරක අරමුදල ස්ථාපිත වී ඇත. මෙම අරමුදලේ මූල්‍යයන් සංචාරක සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා යොදවනු ලබයි. සංචාරක සංවර්ධන බදු එකතු කිරීම සහ බෙදා හැරීම 2003 අංක 28 දරණ මුදල් පනතේ සහ 2005 අංක 38 දරණ සංචාරක පනත අනුව සිදු වේ.

**2. ගිණුම්කරණ අවශ්‍යතාවය**

අරමුදලේ ගිණුම් සකස් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ගිණුම් ප්‍රමිත සහ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුව පිලියෙල කර ඇත.

**3. බදු - අරමුදල් සම්පත්**

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---:|---:|
| අපගමන බදු | 1,604,887,048.67 | 1,161,685,657.02 |
| සංචාරක සංවර්ධන බදු | 1,014,153,899.71 | 809,438,903.76 |
| **එකතුව** | **2,619,040,948.38** | **1,971,124,560.78** |

**3.1 අපගමන බදු**

සංචාරක පනතේ 23(2) (අ) වගන්තිය යටතේ සමස්ථ අපගමන බදු ආදායමෙන් 1/3 ක ප්‍රමානයක් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවනු ලැබේ.

| **අපගමන බදු** | රු. |
|---|---:|
| 2013 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා අපගමන බදු ලැබීම් | 1,320,912,601.71 |
| 2013 වසරට ලැබිය යුතු අපගමන බදු (වෙන් කිරීම) | 281,698,177.87 |
| 2012 වසරේ ඇස්තමේන්තු ගත වෙනස | 2,276,269.09 |
| **2013 වසර සඳහා සමස්ථ අපගමන බදු** | **1,604,887,048.67** |

- 2012 වසරේ ඇස්තමේන්තු ගත වෙනස වූ රු. 2, 276,269.09 ක ප්‍රමානය මෙම වසරේ අතිරික්තය / ඌනතාවය වශයෙන් මූල්‍ය කාර්යය සාධනයේදී හඳුනා ගෙන ඇත.

### 3.2 සංචාරක සංවර්ධන බදු

2003 අංක 28 දරණ මුදල් පනත අනුව සංචාරක ක්ෂේත්‍රයට අයත් සෑම ආයතනයක්ම සංචාරක සංවර්ධන බදු ගෙවිය යුතු වේ. මෙම සංචාරක සංවර්ධන බදු මුල්‍ය එකතු කිරීම / බැර කිරීම සංචාරක සංවර්ධන අරමුදලට කරනු ලැබේ. 2013 ජනවාරි - දෙසැම්බර් දක්වා අදාල කාල පරිච්ඡේදය තුල රුපියල් මිලියන 580.60 ක මුදලක් බදු වශයෙන් එකතු වී ඇත. තවද 2013 ඔක්තෝබර් - දෙසැම්බර් කාල පරිච්ඡේදය සඳහා අපගමන බදු වශයෙන් රු. මිලියන 352 ක මුදලක් ඇස්තමේන්තු ගත ආදායම ලෙස ගිණුම් ගත කොට ඇත.

| සංචාරක සංවර්ධන අරමුදල | රු. |
|---|---|
| | |
| මුල්‍ය ලැබීම් ජනවාරි - දෙසැම්බර් 2013 | 580,691,090.74 |
| 2013 ඔක්තෝබර් - දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුල්‍යයන් (ඇස්තමේන්තුගත) | 352,000,000.00 |
| 2012 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වෙනස | 81,747,020.86 |
| සංචාරක සංවර්ධන බදු නැවත ගෙවීම් | (284,211.89) |
| **2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මුළු සංචාරක සංවර්ධන බදු ආදායම** | **1,014,153,899.71** |
| | |

#### 3.2.1 පූර්ව වර්ෂ ආදායම

ඇස්තමේන්තු ගත රු. 208, 000,000.00 ප්‍රමානය 2012 වසර වෙනුවෙන් ලැබිය යුතු වේ. එනමුත් සත්‍ය ලැබීම් ලෙස රු. 289,747,020.86 ක මුල්‍ය ප්‍රමානයක් අදාල කාල පරිච්ඡේදය තුල ලැබී ඇත. ඒ අනුව 2013 ගිණුම් අනුව මෙම මුල්‍ය වටිනාකම හඳුනාගෙන ඇති අතර ඒ අනුව ගිණුම්මය ඇස්තමේන්තු වෙනස වර්තමාන කාල පරිච්ඡේදයෙහි ආදායමක් ලෙස සළනා ඇත.

### 4. වෙනත් ආදායම්

වෙනත් ආදයම් ලෙස ගිණුම් ගත කොට ඇති වටිනාකම තුල අන්තර්ගත වන්නේ මුදල් පනත ප්‍රකාරව නියමිත දිනට ගෙවීම් සිදු නොකල ලියාපදිංචි ආයතනයන්හි ප්‍රමාද ගෙවීම් මත අයකල පොලී ආදායම හා අගරු චෙක්පත් සඳහා ලද අතිරික්ත ලැබීම් ප්‍රමානයයි

| | Rs: |
|---|---|
| 2013 වසර සඳහා බදු පමා කිරීමේ පොලිය එකතු කිරීම | 6,099,589.95 |
| අතිරික්ත ලැබීම් / අගරු චෙක්පත් හිමියන්ගෙන් | 347.00 |
| **එකතුව** | **6,099,936.95** |

5. අරමුදල් පරිපාලන පිරිවැය

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| මුද්දර ගාස්තු | 63,250.00 | 68,390.35 |
| පරිපාලන වියදම් | 5,101,267.45 | 4,064,827.73 |
| විගණන ගාස්තු | 29,100.00 | 29,100.00 |
| තැපැල් ගාස්තු | 40.00 | - |
| **එකතුව** | **5,193,657.45** | **4,162,318.08** |

6. මූල්‍ය පිරිවැය

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| බැංකු ගාස්තු | 5,943.00 | 7,192.86 |
| **එකතුව** | **5,943.00** | **7,192.86** |

7. අරමුදල් බෙදාහැරීම්

2005 අංක 38 දරණ සංචාරක පනතේ 24 (8) වගන්තිය අනුව අරමුදල බෙදා හැරීම පහත දැක්වෙන පරිදි වසර තුල සිදුවිය.

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 366,791,779.88 | 275,898,576.41 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය | 1,833,958,899.42 | 1,379,492,882.05 |
| ශ්‍රී ලංකං සාචාරක හෝටල් කළමනාකරණ ආයතනය | 314,392,954.19 | 236,484,494.07 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය | 104,797,651.40 | 78,828,164.69 |
| **එකතුව** | **2,619,941,284.88** | **1,970,704,117.21** |

## 8. ලැබිය යුතු මූල්‍ය

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| ලැබිය යුතු අපගමන බදු | 281,698,177.87 | 190,184,578.80 |
| ලැබිය යුතු සංචාරක සංවර්ධන බදු | 352,000,000.00 | 208,000,000.00 |
| ණයගැතියන් | 188,726.17 | 3,311,731.87 |
| **එකතුව** | **633,886,904.04** | **401,496,310.67** |

## 9. ගෙවිය යුතු මූල්‍ය

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| උපචිත වියදම් - පරිපාලන පිරිවැය | 3,761,568.99 | 1,990,349.71 |
| උපචිත වියදම් - විගණන ගාස්තු | 29,100.00 | 58,200.00 |
| උපචිත වියදම් - මුද්දර ගාස්තු | 47,125.00 | 20,175.00 |
| වෙනත් ජංගම වගකීම් | 53,037.00 | - |
| **එකතුව** | **3,890,830.99** | **2,068,724.70** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ටීඑම්2/කේ/ටීඩීඑෆ්/1/13/02 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2014 ජුනි [illegible] දින |

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

**සංචාරක සංවර්ධන අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

සංචාරක සංවර්ධන අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කල යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සංචාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 24(2) වගන්තිය සංශෝධිතව කියවිය යුතු 2003 අංක 25 දරන මුදල් පනතේ 11 කොටස | සංචාරක බදු අය කර ගැනීමේ වාර්තා සංචාරක සංවර්ධන බදු (සං.සං.බ) අය කර දින 30 ක් ඇතුළත මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවත් අරමුදල මෙම නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ | |
| I. 24 (3) වගන්තිය | සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති සකස් කර නොතිබුණි. |
| II. 24 (8) වගන්තිය | සංචාරක සංවර්ධන අරමුදලේ බැරට ඇති සියළු මුදල් අදාල ආයතන වෙත බෙදා හැරිය යුතු වුවත් 2013 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුමේ රු.822,889,100 ක මුදලක් බෙදාහැරීමට තිබුණි. |
| (ඇ) 2003 අංක 25 දරන මුදල් පනතේ 2 (ආ) උප වගන්තිය | ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියෙකු සඳහා නිකුත් කරන සෑම ටිකට් පතකින්ම බදු අයකර ඉන් කොටසක් අධිකාරිය වෙත ප්‍රේෂණය කළ |

යුතු වුවත් එලෙස නැව් මගින් ගමන්කරන මගීන්ගෙන් බදු අයකර අධිකාරිය වෙත එවා නොතිබුණ අතර නැව් මගින් ගමන් ගන්නා මගීන්ගෙන් අයවීම් නොමැති බවට සනාථ කිරීම් ලබාගෙනද නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි අංක 486

2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලයට අදාල අහරු චෙක්පත් 7 ක එකතු වටිනාකම වූ රු.143,504 ක ප්‍රමාණය අයකිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ වැඩ කටයුතුවලින් ජනනය වූ ආදායම රු. මිලියන 2,625 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ආදායම රු. මිලියන 1,975 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 650 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සංචාරක සංවර්ධන බදු ආදායම් රු. මිලියන 443.2 කින් සහ අපගමන බදු ආදායම රු. මිලියන 204.7 කින් වැඩි වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ ආදායම රු.මිලියන 2,625 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු. මිලියන 1,975 සමග සැසඳීමේදී සියයට 32.9 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ අරමුදලේ පරිපාලනය වෙනුවෙන් වැය කර තිබුණු රු. මිලියන 4 සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුලදී ඒ සඳහා රු.මිලියන 5ක් වැය කර තිබුණි. ඒ අනුව පරිපාලන වියදම සියයට 25 ක වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

4.1.1 අරමුදල් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදල මගින් පරිපාලන වියදම් ලෙස රු. 5,193,657 ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. එසේ වුවත්, පරිපාලන වියදම් ගෙවීමට 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ විධිවිධාන සලසා නොතිබුණි.

(ආ) 2003 අංක 25 දරන මුදල් පනතේ විධිවිධාන අනුව 2003 අගෝස්තු 29 දිනැති අංක 1303/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව අපගමන බද්ද ගුවන් මගින් පිටවන සෑම තැනැත්තෙකුගෙන්ම එක්සත් ජනපද ඩොලර් 15 ක්ද, නැවකින් පිටත්වන සෑම තැනැත්තෙකුගෙන්ම එක්සත් ජනපද ඩොලර් 2.5 ක් අය කල යුතු වුවද, මෙම අපගමන බද්ද අය කරන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2004 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා එක්සත් ජනපද ඩොලර් එකකට රු 100 ක විනිමය හුවමාරු අනුපාතයක් පදනම් කරගෙන මෙම බද්ද අය කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේදී හා ඊට පෙර වර්ෂවලදී ද අරමුදලට ලැබිය යුතු අපගමන බදු සැලකිය යුතු ප්‍රමාණයක් අහිමි වී තිබුණි. එම ප්‍රමාණය රු. මිලියන 400 ක් බව හෙළිදරව් විය.

(ඇ) සංචාරක සංවර්ධන බදු අයකර ගත යුතු ආයතන පිළිබඳව දත්ත සමුදායක් සකස් කර නොතිබුණි. තවද ඒ ඒ වර්ෂ වල අය කල බද්ද හා ආයතනවල විකුණුම් ආදායම ලේඛනගත කර නොතිබූ බැවින් හිඟ බදු පිළිබඳව නියාමනයක් සිදු කර නොතිබුණි.

(ඈ) 2003 දෙසැම්බර් 11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයේ 1 හා 4 ඡේදයන්හි නියෝග ප්‍රකාර සංචාරක බදු මුදල් නොගෙවීම නිසා පනවන ලද දඩ මුදල් ප්‍රමාණවත් නොවීම මත අධිකාරියට මූල්‍යමය පාඩුවක් සිදුවී තිබුණි.

(ඉ) 2013 අංක 25 දරන මුදල් පනතේ 4(2) වගන්තිය ප්‍රකාර ගුවන් සමාගම් විසින් නියමිත කාලය තුල බදු නොගෙවන අවස්ථාවලදී අදාල දඩ පොලී සමග එකී මුදල් අයකර අධිකාරිය වෙත ප්‍රේෂණය කරන්නේද යන්න තහවුරු කිරීම් කරවාගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 6.5.1 ජේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත අවසන් ගිණුම් ඉදිරිපත් කලයුතු වුවත් 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2014 මාර්තු 14 වන දිනදී ය.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා සත්‍ය අගයන් අතර සැලකිය යුතු විචලනයන් (විචලන පරාසය සියයට 9 සිට සියයට 15 දක්වා) සහිත විෂයන් 03ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබුණු බව දක්නට නොලැබුණි.

6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය.

(ආ) අරමුදල් බෙදා හැරීම.

(ඇ) සංචාරක සංවර්ධන බදු එකතු කිරීම.

(ඇ) අපගමන බදු එකතු කිරීම.

(ඉ) බලපත්‍ර හිමි ආයතනවල මූල්‍ය වාර්තා සමාලෝචනය.

එච්.ඒ.එස් සමරවීර

විගණකාධිපති